# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1841/8 - 2013 දෙසැම්බර් මස 18 වැනි බදාදා - 2013.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 07 දරන සමාගම් පනත

2007 අංක 07 දරන සමාගම් පනතේ 477 වැනි හා 157 (5) වගන්තිය සමග කියවිය යුතු 527 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

සමාගම් (ගාස්තු) නියෝග

1964 සැප්තැම්බර් මස 04 වැනි දිනැති අංක 14150 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1938 අංක 51 දරන සමාගම් ආඥාපනතේ (145 වැනි අධිකාරය) 130 (7) වැනි සහ 351 වැනි වගන්ති ප්‍රකාරව පනවනු ලැබේ. නියෝගයේ 9 (1) ඡේදයේ සඳහන් ගාස්තු නියෝගය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ ;

**උපලේඛනය**

| *අනු අංකය* | *ගාස්තු වර්ගය* | *සංශෝධිත ගාස්තුව (වැට් රහිත)* |
|---|---|---|
| 1 | ගණන් පරීක්ෂකවරු තනි පුද්ගලයෙක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා | රු. 5,000.00 |
| 2 | ගණන් පරීක්ෂකවරු හවුල් ව්‍යාපාර ලෙස ලියාපදිංචි කිරීම සඳහා | රු. 10,000.00 |
| 3 | ලියාපදිංචි තනි පුද්ගලයෙක් ගණන් පරීක්ෂක තනතුර වාර්ෂිකව අලුත් කිරීම සඳහා | රු. 3,000.00 |
| 4 | ලියාපදිංචි ව්‍යාපාරික වෘත්තීය ගණන් පරීක්ෂක ආයතනවල ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම සඳහා | රු. 5,000.00 |

01 - 88/1


1A - PG 01878 — 410 (2013/12)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**123 අධිකාරිය**

**සමිති**

2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධිත) පනත සමග කියවිය යුතු 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ (123 වන අධිකාරය) 19 වන වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

**සමිති (ගාස්තු) නියෝග**

1954 සැප්තැම්බර් මස 13 වැනි දිනැති අංක 10703 දරන ගැසට් පත්‍ර මගින් පළ කරන ලද සමිති ගාස්තු නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | සමිති ලියාපදිංචි කිරීම | රු. 2000.00 |
| 2. | සමිති ව්‍යවස්ථා සංශෝධනය කිරීම | රු. 1000.00 |
| 3. | සමිතියක සහතික පිටපත් නිකුත් කිරීම | රු. 200.00 |
| 4. | සමිතියක වාර්ෂික වාර්තාවක් ගොනු කිරීම | රු. 1000.00 |
| 5. | සමිතියක ගොනු පරීක්ෂා කිරීම | රු. 100.00 |

01 - 88/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.